# සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

# ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

# තනතුරු ඇබෑර්තු

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ පුරප්පාඩුව පවතින පහත තනතුරු සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**01.** **අධ්‍යක්ෂ ජනරාල් (ස්ථිර)**

සේවා ශ්‍රේණිය : ජ්‍යෙෂ්ඨ කළමනාකාර

1. සුදුසුකම් :

(1.1) බාහිර අයදුම්කරුවන් :-

(අ) විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / මූල්‍ය කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය හෝආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමග

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / මූල්‍ය කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය හෝආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ කළමනාකරණය පිළිබඳ පිළිගත් වරලත් වෘත්තීය ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වයක් ලබා තිබිම.

සහ

උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රාජ්‍ය සංස්ථාවක,ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක “කළමනාකාර මට්ටමේ” තනතුරුවල අවම වශයෙන් වසර 20 ක පළපුරුද්ද (අවම වශයෙන් මින් වසර 5 ක් වත් ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ විය යුතුය.)

හෝ

(ආ) විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / මූල්‍ය කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ප්‍රථම උපාධියක් ලබා තිබීම.

සමඟ

විද්‍යාව / කෘෂිකර්මය / ව්‍යාපාර පරිපාලනය / මානව සම්පත් කළමනාකරණය / මූල්‍ය කළමනාකරණය /රාජ්‍ය කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව යන විෂය ක්ෂේත්‍රයකින් ආචාර්ය උපාධියක් ලබා තිබීම.

සහ

ආචාර්ය උපාධියක් ලබා ගැනීමෙන් පසු රාජ්‍ය සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ පිළිගත් පෞද්ගලික අංශයේ ආයතනයක ජ්‍යෙෂ්ඨ කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 05 ක විශ්ෂ්ට සේවා වාර්තාවක් හිමි නිලධාරියෙකු වශයෙන් පළපුරුද්ද

(1.2) අභ්‍යන්තර අයදුම්කරුවන් :-

ආයතනයෙහි ජ්‍යෙෂ්ඨ කළමනාකරණ සේවා ගණයෙහි තනතුරක අවම වශයෙන් වසර පහ(05) ක අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සමඟ

බහුවිධ කාර්යයන්හි නියුතු කාණ්ඩායම් සඳහා නායකත්වය සැපයීමෙහි ලා මෙන්ම මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව කළමනාකාරණයෙහි ලා නිශ්චිත ප්‍රවීණතාවය.

(ඇ) වයස : අවු: 35 ට නොඅඩු සහ අවු: 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස සීමාව බල නොපායි.

2. වැටුප : HM2-1 - රු.(91,645 -12x2700-124,045)

3. වෙනත් :

සෑම ඉල්ලුම්කරුවෙක්ම,

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

3.2 තනතුරට පැවරෙන කාර්යන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

3.3 විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

4. බඳවා ගැනීමේ ක්‍රමය

පත්වීම් බලධරයා විසින් පත් කෙරෙන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත පරීක්ෂණයකින් තෝරා ගැනීමෙන් මෙම තනතුරට බඳවා ගනු ලැබේ. ඉහළම ලකුණු ලැබූවන් අතරින් කුසලතා අනුපිළිවෙල අනුව තෝරා ගැනීම සිදු කරනු ලබයි.

4. බඳවා ගැනීමේ ක්‍රමය

පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම මගින් ඉල්ලුම්පත් කැඳවීමෙන් පසු පහත සඳහන් විකල්ප අතරින් යෝග්‍ය විකල්පයක් මගින් බඳවා ගැනීම සිදු කරනු ලැබිය හැකිය.

a) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බාහිර අයදුම්කරුවන් බඳවා ගැනීම.
b) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් අභ්‍යන්තර අයදුම්කරුවන් බඳවා ගැනීම

ඉහත සඳහන් සුදුසුකම්වලින් හෙබි අයදුම්කරුවන් තමන් විසින් සකස් කළ අයදුම්පත්‍රයක් 2024.04.22 දිනට පෙර යොමු කළ යුතු අතර, ඊට තමාගේ ජීව දත්ත පත්‍රිකාවක් අමුණා, අදාළ සහතිකවල සහතික කළ පිටපතක් ද සහිතව දිනට හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට සැලැස්විය යුතුය.

ඉදිරිපත් කරන තොරතුරු අනුව සුදුසුකම් සපුරා ඇති බවට සෑහීමකට පත්විය හැකි අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

රාජ්‍ය දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතනවල සේවය කරන නිලධාරීන්ගේ අයදුම්පත්‍ර තම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ නිර්දේශය සහිතව තෝරා ගතහොත් නිදහස් කිරීමට හැකි ද යන්න සඳහන් කර එවිය යුතුය.

අයදුම්පත් බහා එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කර එවිය යුතුය.

සභාපති
ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව
අංක 475
කඩුවෙල පාර
බත්තරමුල්ල
2024.04.08